www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජර්මනිය තුල හිට්ලර් පුනරුත්ථාපනය කිරීම

Hitler’s resurrection in Germany

2018 ඔක්තෝබර් 12

ජර්මනියේ නාසි නායකයා බර්ලින්හි බංකරයක් තුල සිය දිවි නසාගැනීමෙන් වසර හැත්තෑ තුනකට පසු, ඇඩොල්ෆ් හිට්ලර්ගේ වචන හා අදහස් ජර්මනියේ වඩාත් ම ප්‍රමුඛ දිනපතා පුවත්පත්වලින් එකක පුනරුත්ථාපනය කරනු ලැබ ඇත.

හිට්ලර්ගේ තන්ත්‍රය විසින් සිදුකරන ලද අපරාධවල පරිමානය කොතෙක් ද යත්, ඔහුගේ ෆැසිස්ට්වාදී හා යුදෙව්-විරෝධී ප්‍රලාප ජර්මනිය තුල තහනම් කරනු ලැබිනි. ඔහුගේ විෂකුරු ප්‍රකාශනය වන මයින් කාම්ෆ් (මගේ අරගලය) පලකිරීම ජර්මානු ආන්ඩුව විසින් වසර 70ක් පුරා තහනම් කරන ලද අතර, පාදක සටහන් සහිත වූ එහි සංස්කරනයක් යලි පලකරන ලද්දේ 2016 දී පමනි.

එහෙත් මේ වනවිට, ජර්මනිය සඳහා විකල්පය (ඒඑෆ්ඩී) පක්ෂයේ සභාපති ඇලෙක්සැන්ඩර් ගවුලන්ඩ් විසින් ලියන ලද ආරාධිත තීරු ලිපියක්, ඔක්තෝබර් 6 දා පුලුල් ම ජාත්‍යන්තර බෙදාහැරීමක් සහිත ජර්මානු පුවත්පත වන *ෆ්‍රැන්ක්ෆර්ටර් අල්ගෙමයින් සයිටුං (එෆ්ඒඉසෙඩ්)* තුල පලකරන ලද අතර, එය බොහෝසෙයින් පදනම් වන්නේ 1933 නොවැම්බරයේ හිට්ලර් බර්ලිනයේ සීමන්ස් කම්කරුවන් අමතා කල කතාවක් මත ය.

“ගවුලන්ඩ්ගේ පබැඳුම පැහැදිලි ව ම හිට්ලර්ගේ පබැඳුමට සමීප වේ” යනුවෙන් ඉතිහාසඥ වොල්ෆ්ගෑං බෙන්ස් *ටැගෙ ස්ස්පීගල්* තුල අදහස් දැක්වී ය: “එෆ්ඒඉසෙඩ් පුවත්පතට ඔහුගේ ආරාධිත තීරු ලිපිය ලියන විට ඒඑෆ්ඩී නායකයා, නාසි නායකයාගේ 1933 කතාව තම මේසය මත තබාගෙන සාරාංශකරනය කල බව පෙනෙන්නට තිබේ.”

නාසිවාදය හා යුදෙව්-විරෝධය පිලිබඳ ප්‍රාමානිකයෙකු වන බෙන්ස්, තීරු ලිපිය පිලිබඳ ව අදහස් දක්වමින් “1933 මෙන්ම එම බලපෑම ම පුපුරා යමින් තිබේ යයි යමෙක් සැක කරනු ඇතැයි” කීවේ ය. ඒඑෆ්ඩීය, නාසි යුගයේ “ඉතුරු පහදු ජාතිකවාදී ව්‍යාපාරය එන්එස්ඩීඒපී (නාසි පක්ෂය) හා එහි අපගතයන් සමග සැලැස්මක් ලෙස උනුසුම් කර” ඉදිරිපත් කරමින් සිටි යයි පෙනෙන්නට තිබේ යයි ඔහු කීවේ ය.

*එෆ්ඒඉසෙඩ්* පුවත්පත තුල ගවුලන්ඩ් තම පක්ෂයේ “ජනතාවාද”, “නව නාගරික ප්‍රභුවකට” එරෙහි ව ආරක්ෂා කරමින්, “සාම්ප්‍රදායික මධ්‍යම පන්තියේ” හා “රැකියා සාමාන්‍ය ජනයාගේ” අවශ්‍යතාවන් යන පදනමින් සාධාරනීකරනය කරයි. “මෙම ගෝලීය පන්තියේ” සාමාජිකයෝ “මුලුමනින් ම පාහේ මහා නගර තුල ජීවත් වෙමින් චතුර ලෙස ඉංග්‍රීසි කතා කරන අතර, ඔවුන් තම රැකියාවන් වෙනස් කරමින් බර්ලිනයේ සිට ලන්ඩනයට හෝ සිංගප්පූරුවට විතැන් වූ විට, ඒ සෑම තැනක දී ම, එකම වර්ගයේ මහල් නිවාස, නිවාස, අවන්හල්, සාප්පු හා පුද්ගලික පාසල් සොයා ගනිති... මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම නව ප්‍රභූව ඔවුන්ගේ අදාල ස්වදේශයට දක්වන බැඳීම දුර්වල ය. වෙන්වුනු සමාන්තර සමාජයක් තුල ඔවුන්ට තමන් ලෝක පුරවැසියන් ලෙස දැනේ.”

1933 දී හිට්ලර් ද මහජනයා එකිනෙකාට එරෙහි ව කෝපගැන්වීම පිනිස “කුඩා, අක්මුල් රහිත ජාත්‍යන්තර කවයක්” හෙලාදැකීමේ දී මේ හා සමාන වචන භාවිතා කලේ ය: “ඔවුන් වනාහි සෑම තැනක ම ජීවත් වන, කිසි තැනක් තමන්ගේ රට ලෙස නොසලකන, එනම් අද දින බර්ලිනයේ, හෙට බ්‍රසල්ස්හි, අනිද්දා පැරිසියේ හා ඉන්පසු යලිත් ප්‍රාග්, වියානා හෝ ලන්ඩනයේ ජීවත් වෙමින් ඒ සෑම තැනක් ම තමන්ගේ නිවස ලෙස හඟින අය යි” යනුවෙන් ඔහු තම ශ්‍රාවකයට කී අතර, එම කතාවට “යුදෙව්වන්!” යනුවෙන් හඬ තලමින් බාධා කරන ලදී. “ඔවුන්ට ඕනෑම තැනක ව්‍යාපාර කල හැකි නිසා ජාත්‍යන්තර අවයව ලෙස සලකනු ලැබිය යුතු එකම වර්ගය ඔවුන් ය.”

“මහජනයා ඔවුන්ගේ භූමියට ගැටගැසී, ඔවුන්ගේ ස්වදේශයට ගැටගැසී, ඔවුන්ගේ රාජ්‍යයේ, එනම් ජාතියේ හැකියාවන්ට ජීවිතය සීමා වී සිටින්නන් ය. මහජනයාට ඔවුන් ව අනුගමනය කල නො හැක” යයි කියමින් හිට්ලර් ජාතික අවයවයක් ලෙස “මහජනයා” මෙම “ජාත්‍යන්තර කන්ඩායමට” විරුද්ධ ව පිහිටුවාලී ය. ගවුලන්ඩ්ගේ “උනුසුම් කරන ලද” සංස්කරනය “...තවමත් තමන්ගේ දේශය වටිනාකමක් සහිත දෙයක් වන සහ සංක්‍රමනිකයන් පැමිනීම නිසා තම දේශය පලමු ව අහිමි කරගන්නන්” ගැන සඳහන් කරයි. “ඔවුන්ට පිටතට ගොස් වෙනත් තැනක ගොල්ෆ් ක්‍රීඩා කල නො හැක.”

මෙම පේලිවල යුදෙව්-විරෝධී තානය පැහැදිලි ය. නාසි ප්‍රචාරනය තුල මුල් රහිත “විශ්වදේශී” යුදෙව්වන්ගේ රූපය රතු භූයපටක් මෙන් දිව යයි. එහෙත් ගවුලන්ඩ් හිට්ලර්ගෙන් නයට ගන්නා දේවල් රට වඩා දුර යයි. ජාතිය හා දේශය -ලේ හා පස- දේවත්වයට නැංවීම ෆැසිස්ට්වාදයේ හා නාසිවාදයේ අරටුව සමන්විත කලේ ය.

නාසීන්ගේ උන්මත්තක ජාතිකවාදය, ධනේශ්වර ගෝලීය ආර්ථිකයේ ප්‍රහාරවලින් ජර්මානු මධ්‍යම පන්තිය හෝ කම්කරු පන්තිය ආරක්ෂා කලේ නැත. එය ඔවුන් ව යවන ලද්දේ ජර්මානු අධිරාජ්‍යවාදයේ අවශ්‍යතා සඳහා දෙවන ලෝක යුද්ධයේ සංග්‍රාම භූමිවල ඝාතනය වීමට ය. මෙම උන්මත්තක ජාතිකවාදය, “සකල දේශවාසී නිර්ධනයිනි එක්වව්!” යන කාහල නාදය සමගින් 1848 දී මාක්ස් හා එංගල්ස් විසින් *කොමියුනිස්ට් ප්‍රකාශනය* පලකල තැන් පටන් ජාත්‍යන්තරවාදී වන විප්ලවවාදී කම්කරු ව්‍යාපාරයට විරුද්ධ විය.

ධනේශ්වර ජාතිකවාදය වැඩවසම් බෙදීම් හා ආඥාදායකත්වයට එරෙහි ව යොමු වූ තාක් කල්, එය ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවනතා සමග බද්ධ ව තිබුනි. එහෙත් එම යුගය 19වන ශතවර්ෂයේ දී අවසන් විය. ජාතික රාජ්‍යය ජාත්‍යන්තර වර්ධනයට හා ධනේශ්වර ආර්ථිකයේ ඒකාග්‍රකරනයට වඩ වඩා බාධාකාරී විය. ජර්මනිය හා අනෙකුත් අධිරාජ්‍යවාදී බලයෝ, ඔවුන්ගේ ප්‍රතිමල්ලවයන්ගේ වියදමින් ලෝකය බලහත්කාරී ලෙස යලි බෙදාගැනීමට මං සෙවූ හ. පලමු හා දෙවන ලෝක යුද්ධවලට හේතු වූයේ එය යි.

හිට්ලර් සීමන්ස්හි දී ඔහුගේ කතාව කල 1933 නොවැම්බර් මාසයේ ම, "ජාතිකවාදයේ මලමිනියේ වෛරසය යොදාගෙන ආර්ථික ජීවිතය ප්‍රතිශක්තිකරනය කිරීමට දරන උත්සාහයන්, ෆැසිස්ට්වාදය යන නම දරන රුධිරය විෂ වීමට හේතු වේ" යයි ලියොන් ට්‍රොට්ස්කි ලීවේ ය. "ලෝක තලය මත ගිනිකඳු වර්ගයේ පිපිරීම් හා විනාශකාරී ගැටුම් සූදානම් කරන ෆැසිස්ට්වාදී ජාතිකවාදය, විනාශය මිස වෙන කිසිවක් දරා නො සිටී" ("ජාතිකවාදය හා ආර්ථික ජීවිතය"). වසර හයකට පසු පෝලන්තය ආක්‍රමනය කල හිට්ලර් දෙවන ලෝක යුද්ධය ඇරඹී ය.

හිට්ලර්ගේ රුධිර-හා-පාංශුමය දෘෂ්ටිවාදය පුනරුච්ජාරනය කිරීම පිනිස ඒඑෆ්ඩී සභාපතිවරයාට ප්‍රමුඛ පෙලේ ජර්මානු පුවත්පතක් සිය පිටු විවෘත කර දී තිබීම, හුදෙක් පෙන්නුම් කරන්නේ ජර්මනිය තුල අන්ත දක්ෂිනාංශය කොතෙක් දුරට යලි කරලියට පැමින ඇද්ද යන්න යි. වැඩෙන ජාත්‍යනතර ආතතීන්, වෙලඳ යුද්ධය හා සමාජීය ගැටුම්වලට මුහුන දී සිටින ජර්මානු පාලක පන්තිය එහි අපරාධකාරී සම්ප්‍රදායන්ට ආපසු යමින් සිටී.

*එෆ්ඒඉසෙඩ්* පුවත්පතේ ප්‍රකාශකයෝ තමන් මන්ඩපයක් තනා දෙන්නේ කාටදැයි හරියට ම දැන සිටිය හ. ඒඑෆ්ඩීයට බැඳීමට පෙර ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ (සීඩියූ) ර්නියා ස්ටාල්හෙල්ම් (වානේ හිස්වැසුම්) අංශය තුල වසර 40ක් පුරා දේශපාලන වෘත්තීය ජීවිතය ගත කර තිබුනු ගවුලන්ඩ්, පක්ෂයේ නායකත්වය බර්න්ඩ් හොකේ වැනි අන්ත දක්ෂිනාංශික හා ෆැසිස්ට් බලයන්ට විවෘත කර ඇත. හිට්ලර් හා නාසීහු "වසර දහස් ගනනක සාර්ථක ජර්මානු ඉතිහාසයේ කුරුලු බෙට්" ය යනුවෙන් මේ වසරේ ජුනි මාසයේ ප්‍රකාශයක් නිකුත් කල විට ඔහු දේශපාලනික ව සිටගෙන සිටින්නේ කොහිදැයි ප්‍රදර්ශනය කරනු ලැබිනි.

මහ මැතිවරනයේ දී ඒඑෆ්ඩීය ලබාගත්තේ ජන්දවලින් සියයට 12.6 ක් පමනක් වුව ද දැන් මධ්‍යම ආන්ඩුවේ දේශපාලන තානය සකසන්නේ එය යි. ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ මහා සභාග ආන්ඩුවේ සරනාගත පිලිවෙත මෙන් ම පොලීසියේ හා රහස් ඔත්තු සේවාවේ වැඩිකරන ලද බලතල සහ සන්නද්ධ හමුදාවල පිරිවැය වැඩිකිරීම ද ඒඑෆ්ඩීයේ මුද්‍රාව දරයි.

එහෙත් 1930 ගනන්වල නාසීන්ට වෙනස් ව ඒඑෆ්ඩීය ෆැසිස්ට්වාදී මහජන ව්‍යාපාරයක නායකත්වය නො දරයි. පුලුල් මහජනයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලබයි. බොහෝ නගරවල දක්ෂිනාංශික අන්තරායට එරෙහි ව මහජන විරෝධතා සුලභ ව දක්නට ලැබේ. මේ වසර තුල ඉහල දමන ලද රාජ්‍ය බලතල, සමාජ අසමානතාව හා මිලිටරිවාදයට එරෙහි ව මියුනිච්හි පමනක් තුන්වතාවක් දසදහස් ගන්නා දෙනා විරෝධය දක්වා තිබෙන අතර, ඔක්තෝබර් 13දා බර්ලිනයේ වර්ගවාදයට එරෙහි ව 40,000ක් දෙනා විරෝධතා පැවැත්වීමට නියමිත ය.

එනමුදු ජර්මානු මහජනයා අතර පවතින දැවැන්ත සමාජ අතෘප්තිය මෙන් මෙම විරෝධය ද නිල දේශපාලනය තුල ප්‍රකාශනයක් අත්පත් කර නො ගනී. බුන්ඩෙස්ටාග් හෙවත් මධ්‍යම පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ, සංගත මාධ්‍ය ද සමගින් ඒඑෆ්ඩීයේ දේශපාලනය විවෘත ව වැලඳ ගනිමින් සිටිති. මහා සභාගයේ රාමුව ඇතුලත එස්පීඩීය ඒඑෆ්ඩීයේ දක්ෂිනාංශික පිලිවෙත අනුගමනය කරයි. වාම පක්ෂය පෙනී සිටින්නේ ද ජාතිකවාදී මාවතක් වෙනුවෙනි. ගවුලන්ඩ් ද තම (එෆ්ඒඉසෙඩ්) තීරු ලිපිය තුල වාම පක්ෂ නායක සහ්රා වගෙන්ක්නෙක්ට් ව සුවිශේෂව උත්කර්ෂයට නැංවී ය.

ධනවත් මධ්‍යම පන්තියේ පැරනි බොහෝ ලිබරල් නියෝජිතයෝ ඒඑෆ්ඩීය ඉදිරියේ හතරගාතෙන් වැටී සිටිති. මේ සඳහා ලාක්ෂනික උදාහරනයන් වන්නේ, ගවුලන්ඩ් "දක්ෂ පඨිතයක්" ලියා ඇති බව කියමින් "ඒඑෆ්ඩීයට සමපාලනයට" ආයාචනා කල *ස්පීගල්* තීරු ලිපි රචක හා *ෆ්‍රයිටාග්* කර්තෘ ජේකොබ් ඔගස්ටයින් සහ හරිත දේශපාලනඥ බෝරිස් පාමර් ය.

සමාජවාදී සමානතා පක්ෂය (එස්ජීපී) ක්‍රිස්ටොෆ් වැන්ඩ්‍රයර් විසින් රචිත *ඔවුන් ආපසු පැමින සිටින්නේ ඇයි?* යන කෘතිය පලකර ඇති අතර, එය, විශ්ව විද්‍යාල, මාධ්‍ය හා දේශපාලනය වසර ගනනක් තිස්සේ දකුනට පැද්දීම මගින් ඒඑෆ්ඩීයේ නැගීම ක්‍රමානුකූල ව සූදානම් කලේ කෙසේදැයි පෙන්වා දෙයි.

2014 තරම් ඈත දී මාධ්‍යයන් එස්ජීපීයට හා එහි තරුන ව්‍යාපාරය වන සසජාතශිට එරෙහි ව කෝපාග්නිත දඩයමක් ඇවිලවූයේ හිට්ලර් "නපුරු නො වී" යයි සතිපතා පලවන *ඩර් ස්පීගල්* සඟරාව තුල කියාපෑ දක්ෂිනාංශික අන්තවාදී ඉතිහාසඥ ජෝජ් බාබරොව්ස්කි ව විවේචනය කර තිබීම හේතුවෙනි.

මෙම ප්‍රහාරයේ නායක භූමිකාවක් ඉටුකලේ *එෆ්ඒඉසෙඩ්* ය. දැන් පත්‍රයේ සම-කර්තෘවරයා වන ජුර්ගන් කාවුබ් "ට්‍රොට්ස්කිවාදී හිංසනය" යයි චූදිත දෙයට විරුද්ධ ව බාබරොව්ස්කි ව ආරක්ෂා කලේ ය. එස්ජීපීය පෙර දැකි පරිදි, නාසීන්ගේ අපරාධ සුමටකරනය කිරීම ජර්මනිය තුල දක්ෂිනාංශීක, මිලිටරිවාදී හා ආඥාදායක දේශපාලනය යලි හිස එසවීමට මාවත හෙලිපෙහෙලි කලේ ය.

මෙම වර්ධනය ජර්මනියට පමනක් සීමා වූ එකක් නො වේ. එක්සත් ජනපදයේ ද යුරෝපය පුරා ද ධනපති පාලකයෝ ආඥාදායකත්වය හා ෆැසිස්ට්වාදය පුනරුත්ථාපනය කිරීම දෙසට හැරෙමින් සිටිති.

ජර්මනිය තුල මිලිටරිවාදය හා ෆැසිස්ට්වාදය පුනරුත්ථාපනය නැවැත්වීමට ඇත්තේ එක් මාවතක් පමනි. එනම්, ජාත්‍යන්තර කම්කරු පන්තිය විප්ලවවාදී ක්‍රියාමාර්ගයක් මත බලමුලුගන්වමින් එස්ජීපීය හා හතරවන ජාත්‍යන්තරය මහජන සමාජවාදී පක්ෂයක් ලෙස ගොඩ නැගීම යි.

පීටර් ෂ්වාට්ස්

© www.wsws.org